[සීසුපචාලා:]

ඉතො බහිද්ධා පාසණ්ඩා දිට්ඨීසු පසීදන්ති තෙ,
න තෙසං ධම්මං රොචෙමි න තෙ ධම්මස්ස කොවිදා.

අත්ථි සක්‍යකුලෙ ජාතො බුද්ධො අප්පටිපුග්ගලො,
සබ්බාභිභූ මාරනුදෙ සබ්බත්ථමපරාජිතො,
සබ්බත්ථ මුත්තො අසිතො[1] සබ්බං පස්සති චක්ඛුමා.

සබ්බකම්මක්ඛයං[2] පත්තො විමුත්තො උපධිසඞ්ඛයෙ,
සො මය්හං භගවා සත්ථා තස්ස රොචෙමි සාසනන්ති.

අථ ඛො මාරො පාපිමා -පෙ- තත්ථෙවන්තරධායීති.

## 5. 1 9.

## සෙලාසුත්තං.

170. **සාවත්ථියං**—

අථ ඛො **සෙලා** භික්ඛුනී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය **සාවත්ථිං** පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන **අන්ධවනං** තෙනුපසඞ්කමි දිවාවිහාරාය. අන්ධවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි.

අථ ඛො මාරො පාපිමා සෙලාය භික්ඛුනියා භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො සමාධිම්හා චාවෙතුකාමො යෙන සෙලා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සෙලං භික්ඛුනිං ගාථාය අජ්ඣභාසි:

කෙනිදං පකතං බිම්බං ක්වනු[3] බිම්බස්ස කාරකො,
ක්වනු[4] බිම්බං සමුප්පන්නං ක්වනු[3] බිම්බං නිරුජ්ඣතීති.

අථ ඛො සෙලාය භික්ඛුනියා එතදහොසි: කො නු ඛ්වායං මනුස්සො වා අමනුස්සො වා ගාථං භාසතීති. අථ ඛො සෙලාය භික්ඛුනියා එතදහොසි: මාරො ඛො අයං පාපිමා. මම භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො සමාධිම්හා චාවෙතුකාමො ගාථං භාසතීති අථ ඛො සෙලා භික්ඛුනී මාරො අයං පාපිමා ඉති විදිත්වා මාරං පාපිමන්තං ගාථාහි පච්චභාසි:

නයිදං අත්තකතං[5] බිම්බං නයිදං පරකතං[6] අඝං,
හෙතුං පටිච්ච සම්භූතං හෙතුභඞ්ගා නිරුජ්ඣති.

යථා අඤ්ඤතරං බීජං ඛෙත්තෙ වුත්තං විරූහති,
පඨවීරසඤ්ච[7] ආගම්ම සිනෙහඤ්ච තදූභයං.

එවං ඛන්ධා ච ධාතුයො ඡ ච ආයතනා ඉමෙ,
හෙතුං පටිච්ච සම්භූතා හෙතුභඞ්ගා නිරුජ්ඣරෙති.

අථ ඛො මාරො පාපිමා -පෙ- තත්ථෙවන්තරධායීති.

---

1 අසිතො - ස්‍යා. 2. සබ්බකම්මක්ඛයං - මජසං. ස්‍යා, PTS. 3. ක්වනු. - මජසං. 4. ක්වඤ්ච - සීමු. ක්වචි - ස්‍යා. 5. නයිදං පකතං - ස්‍යා. 6. පකතං - ස්‍යා. 7. පඨවිරසං ආගම්ම - මජසං.

[සීසූපචාලාචෝ:]

පාෂාණ්ඩයෝ මේ සස්නෙන් පිටත්හ. ඔහු මිථ්‍යාදෘෂ්ටීන්හි ගැලෙත්. ඔවුන්ගේ දහම නුරුස්නෙමි. ඔහු දහම්හි අදක්‍ෂයෝය.

ශාක්‍යවංශයෙහි උපන් සමාන පුද්ගලයන් නැති සියලු ස්කන්ධාදීන් මැඩ සිටියා වූ මරුන් නෙරපූ සියලු තන්හි නො පැරදුනු සියලු තන්හි මිදුනු (තෘෂ්ණා දෘෂ්ටීන්) අනිඃශ්‍රිත වූ සර්ඥයන් වහන්සේ ඇති සේක. සියලු කර්මයන් ක්‍ෂය කිරීමට පැමිණි උපධිසඞ්ඛ්‍ය සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි ලා මිදුනු පසැස් ඇති ඒ භාග්‍යවතුන් වහන්සේ සියල්ල දක්නා සේක. එ මාගේ ශාස්තෘන් වහන්සේ ය. උන්වහන්සේගේ සස්න රුස්නෙමි.

ඉක්බිති පවිටු මරු තෙමේ ... එහි ම අතුරුදන් විය.

## 5. 1. 9.

## සේලා සූත්‍රය.

170. **සැවැත්නුවර—**

එකල්හි **සේලා** මෙහෙණ පෙරවරු හැද පෙරෙව පාසිවුරු ගෙණ **සැවැත්නුවරට** පිඩු පිණිස පිවිසුනා ය. සැවැත්නුවර පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැලකුනී දිවාවිහරණය පිණිස **අන්ධවනය** වෙත එළඹුනා ය. අන්ධවනයට පිවිස එක්තරා රුක්මුලෙක දිවාවිහරණය පිණිස හුන.

ඉක්බිති පවිටු මරු සේලා මෙහෙණහට බිය තැතිගැණුම් ලොමු-දහ ගැණුම් උපදවනු කැමැත්තේ සමාධියෙන් පහ කරණු කැමැත්තේ සේලා මෙහෙණ වෙත එළඹියේ ය. එළඹ සෙලා මෙහෙණට ගාථායෙන් කී ය:

මේ අත්බව කවරකු විසින් කරණ ලද ද? මේ අත්බැව්හි කාරකයා කවරේ ද? මේ අත්බව කුමක් නිසා උපන්නේ ද? මේ අත්බව කෙසේ නිරුද්ධ වේ ද ?

එකල්හි සේලා මෙහෙණට 'මේ කවරෙක් ද' මිනිසෙක් හෝ නොමිනි-සෙක් හෝ ගාථාව කියා දැ''යි මේ අදහස විය. එකල්හි සෙලා මෙහෙණට 'මේ පවිටු මරු ය. මට බිය තැති ගැණුම් ලොමුදහගැණුම් උපදවනු කැමැත්තේ සමාධියෙන් පහ කරණු කැමැත්තේ ගාථාව කියා'යි මේ අදහස විය. ඉක්බිති සෙලා මෙහෙණ මේ පවිටු මරු යයි දැන පවිටු මරුහට ගාථාවන්ගෙන් පෙරළා කිවුය:

මේ අත්බැව තමා විසින් කරණලද්දෙක් නොවේ. මේ දුකට පිහිට වූ අත්බව මෙරමා විසින් කරණලද්දෙක් ද නොවේ. හේතුව නිසා හට ගත්තේ ය. හේතුව බිඳීමෙන් නිරුද්ධ වේ.

කෙතෙහි වපුළ යම්කිසි බිජුවටෙක් පොළෝරසය ද ජලය ද යන ඒ දෙක ලැබගෙන යම්සේ අකුරු නගා ද?

එසෙයින් ම ස්කන්ධයෝ ද, ධාතුහු ද, ෂඩායතනයෝ ද යන මොහු හේතුව නිසා හට ගත්තෝ ය. හේතුභඞ්ගයෙන් නිරුද්ධ වෙත්.

ඉක්බිති පවිටු මරු තෙමේ ... එහි ම අතුරුදන් විය.